# රුහුණු රම්බා විහාරයේ උරුම කළමනාකරණය පිළිබඳ යෝජනාවලියක්

ජී. අමිත හිමි

පුරාවිද්‍යා අධ්‍යනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.
Keselpothawimala@gmail.com

**ප්‍රමුඛ පදඃ** *රුහුණු රම්බා විහාරය, පුරාවිද්‍යාත්මක උරුමය, උරුම කළමනාකරණ ගැටලු, උරුම සංරක්‍ෂණ යෝජනා*

## හැඳින්වීම

ඓතිහාසික දකුණු පළාතේ පිහිටි ආරාම සංකීර්ණ අතර වැදගත් ස්ථානයක් රම්බා විහාර ආරාම සංකීර්ණයට හිමි වේ. අනුරාධපුර යුගයේ මුල් අවධියේ නිර්මිත මෙම ආරාම සංකීර්ණය ඓතිහාසික අවධි ගණනාවකට හිමිකම් කියන අතර එහි ස්වර්ණමය අවධිය පොළොන්නරුව සමය වේ. ආරාම සංකීර්ණයේ ප්‍රධාන සැලසුමට අනුව අක්කර 250 ක පමණ භූමි සීමාවක මුල් කාලීනව විවිධ ඉදිකිරීම් විසිරී පැවතිය ද වර්තමානය වන විට එය අක්කර 70 කට පමණ සීමා වේ. ආරාම සංකීර්ණයේ දකුණු දිශාවෙන් වළවේ නදිය ගලා බසින අතර බස්නාහිර දිශාවෙන් මාමඩල ඇළ ගලා බසී. මෙම ස්වභාවික පිහිටීම ආරාම සංකීර්ණයේ බාහිර අලංකරණයට මෙන්ම ආරක්‍ෂාව ද සාධනීය ලක්‍ෂණයකි. මෙම ස්වභාවික ජල මූලාශ්‍රය ආශ්‍රිත පිහිටි මෙම ආරාම සංකීර්ණය තැනිතලා භූමියක විහිදී ඇති අයුරු දැකගත හැකි ය. එහි විවිධ අවධිවලට අයත් බෝධිඝර, පිළිම, ගෘහ, දාන ශාලා, ස්තූප, දළඳා මාලිගා, භික්ෂු කුටි, පොකුණු, අභිලේඛන, ප්‍රතිමා ආදි පූජනීය, අර්ධ පූජනීය හා වෙනත් ආගමික වාස්තුවිද්‍යාත්මක ඉදි කිරීම් ගණනාවක් දක්නට ලැබේ. ඒ අනුව මෙම ආරාම පරිශ්‍රය සංස්කෘතික, ස්වභාවික ජීවමාන ආදි උරුම එකතුවක පිළිබිඹුවකි. 1950 දශකයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පළමුවෙන් ම රම්බා විහාර සංකීර්ණය උරුම පරිශ්‍රයක් ලෙස ප්‍රකාශයට පත් කරන අතර ඉන් අනතුරුව 1998 හා 2000 වර්ෂවල සිට මධ්‍යම සංස්කෘතික අරමුදල හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව එක්ව දකුණු පළාතේ උරුම සංරක්‍ෂණ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරනු ලබයි. වර්තමානයේ උරුම පරිශ්‍රය ආශ්‍රිත පුරාවිද්‍යා ගවේෂණ, කැනීම්, සංරක්‍ෂණ, නඩත්තු කටයුතු ආදි ක්‍රමවේද රම්බා විහාර ව්‍යාපෘතිය යටතේ සිදු වේ. ඒ අනුව පැහැදිලි වශයෙන් ම මෙම ආරාම සංකීර්ණය සතු පුරාවිද්‍යාත්මක උරුමය සුරක්‍ෂිත කිරීමට ප්‍රමාණවත් නිලබලය ලත් ආයතන ව්‍යුහයක් පවතින බව පැහැදිලිය.

කරුණු එසේ වුවත් රම්බා විහාර ආරාම සංකීර්ණය සතු සංස්කෘතික හා ස්වභාවික උරුමය දෛනික පරිහානියට පත්වන ආකාරය දක්නට ලැබීම ඛේදනීය තත්ත්වයකි. ඒ අනුව මෙම පර්යේෂණයේ ගැටලුව වන්නේ උරුමය සුරක්‍ෂිත කිරීම සඳහා ප්‍රමාණවත් නෛතික හා භෞතික සාධක ප්‍රමාණවත් පරිදි පැවතිය ද රම්බා විහාර සංකීර්ණය සතු පුරාවිද්‍යාත්මක උරුමය දෛනික උරුම පරිහානියට පත් වන්නේ ඇයි ද යන්න අධ්‍යයනය කිරීමයි. මෙහි දි ආරාම සංකීර්ණය ආශ්‍රිත දේශපාලනික, ආගමික, සාමාජික, සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් හා උරුම සංරක්‍ෂණ යෝජනාවලියක්

ඉදිරිපත් කිරීම මෙම පර්යේෂණයේ අරමුණ ලෙස පෙන්වාදිය හැකි ය.

**ක්‍රමවේදය**

පූර්ව පර්යේෂණ, සිතියම්, සැලසුම්, වාර්තා ආදි පූර්ව සිදු කෙරෙන සාහිත්‍යය මූලාශ්‍රය පරිශීලනයෙන් පසුව සමාජවිද්‍යා පර්යේෂණවල දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය සඳහා යොදා ගනු ලබන නිරීක්ෂණ, සහභාගිත්ව නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා, කේවල අධ්‍යයන හා ප්‍රශ්නාවලි ආදි පර්යේෂණ ක්‍රමවේද යොදා ගැනීමට අපේක්ෂිත ය.

**ප්‍රතිඵලය හා සාකච්ඡාව**

මෙහි දී පළමුවෙන් ම පර්යේෂණ කලාපයේ සංස්කෘතික භූ දර්ශනය හා අගයන් හඳුනාගැනීමට අපේක්ෂිතය. විශේෂයෙන් ම ඓතිහාසික අගය, කලාත්මක හා සෞන්දර්යාත්මක අගය, භාවිතමය අගය පිළිබඳ ව විශේෂ අවධානය යොමු කෙරේ. ඉන් අනතුරුව වර්තමාන උරුම පරිශ්‍රය ආශ්‍රිත ව දක්නට ලැබෙන උරුම සංරක්ෂණ ගැටලු හඳුනාගැනීමට අපේක්ෂිතය. එහි දි ප්‍රධාන අදියර කිහිපයක් යටතේ ගැටලු හඳුනාගැනීම සිදුවේ.

- ඉඩම් පවරා ගැනීමේ ගැටලු
- සංරක්ෂණ හා නඩත්තු කටයුතුවල ගැටලු
- වර්තමාන විහාර සංවර්ධනය ආශ්‍රිත ගැටලු
- කළමනාකරණ සැලසුම්වල පවතින ගැටලු

යන කාරණා පිළිබඳව මූලික ව අවධානය යොමු කෙරේ. මෙහි දී පළමුවෙන් ම ඉඩම් පවරා ගැනීමේ ගැටලු සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කළ යුතු ය. රම්බා විහාර සංකීර්ණයේ ප්‍රධාන සැලසුමේ අක්කර 250ක භූමි සීමාවක පුරාවිද්‍යාත්මක ස්මාරක පැවති බවට සඳහන් වුවද වර්තමානයේ එය අක්කර 70කට පමණ සීමා වේ. ඊට ප්‍රධානතම හේතුව ඉතා සීඝ්‍ර ලෙස ආරාම සංකීර්ණය සතු ඉඩම් මානව පරිභෝජනයට ලක්වීමයි. ඊට සාධනීය සාධකය ලෙස වැලි කැපීම පෙන්වාදිය හැකි ය. කෙසේ නමුත් අදාළ ආයතන ව්‍යුහය ශක්තිමත් ලෙස ඉඩම් නිදහස් කර ගැනීම පිළිබඳබව දායක නොවේ.

ඊට අමතර ව වර්තමානයේ උරුම පරිශ්‍රය ආශ්‍රිත ව සිදු වී ඇති සංරක්ෂණ හා නඩත්තු කටයුතුවල ද ගැටලු දක්නට ලැබේ. ඊට ප්‍රධානත ම හේතුව මෙම පර්යේෂණ ප්‍රධාන සැලසුමකින් තොරව අත්තනෝමතිකව සිදු කිරීමයි. එසේ ම කලාපීය දේශපාලන අධිකාරිය යටතේ වර්තමාන උරුම පරිශ්‍රයේ සිදුවන විහාර සංවර්ධනය මඟින් ද උරුම පරිශ්‍රයට සිදුවන බලපෑම සුළු පටු නොවේ. ඒවා පාලනය කිරීමට අදාළ ආයතන ව්‍යුහය පියවරගනු ලබන්නේ ඉතා අල්ප වශයෙනි.

රම්බා විහාර ආරාම සංකීර්ණයේ වර්තමානයේ දක්නට ලැබෙන ප්‍රබල උරුම කළමනාකරණ ගැටලුවක් ලෙස කළමනාකරණ සැලසුම්වල පවතින දුර්වලතා පෙන්වා දිය හැකිය. විශේෂයෙන් ම අභ්‍යන්තර උරුම පරිශ්‍රය සැකසීමේ ගැටලු, නඩත්තු කටයුතු කළමනාකරණය නොකිරීම, උරුම ස්ථාන අර්ථ නිරූපණය නොකිරීම, අවිධිමත් මාර්ගෝපදේශනය, ස්වභාවික උරුම කළමනාකරණය නොකිරීම ආදි ප්‍රබල ගැටලු රාශියක් හඳුනාගත හැකි ය.

ඒ අනුව මෙම උරුම කළමනාකරණ ගැටලු හා ගැටලු ඇතිවන සන්දර්භය හා අවකාශය හඳුනා ගෙන විධිමත් උරුම සංරක්ෂණ යෝජනාවලියක් සැකසිය යුතුවේ. එහි දී පළමුවෙන් ම ප්‍රධාන සැලසුමකට අනුව ඒවා සිදුකළ යුතු වේ. මෙම ක්‍රියාවලිය අදියර කිහිපයක් යටතේ සිදු කරන්නේ නම් එය වඩාත් යෝග්‍ය

වේ. ඒ අනුව පළමුවෙන් ම සිදුකළ යුතු වන්නේ අවශ්‍ය පුරාවිද්‍යා හා ආයතන සහයෝගිතාවය, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සලසා ගැනීමයි. ඉන් අනතුරුව දෙ වන අදියර ලෙස උරුම පරිශ්‍රය ආශ්‍රිත උරුමය සුරක්ෂිත කළ යුතු ය. එසේම එහිදි අභ්‍යන්තර උරුම පරිශ්‍රය මනාව සැකසීම සිදුකළ යුතු ය. ඉන් අනතුරුව සිව් වන අදියර යටතේ යටිතල පහසුකම් පූරණය කරමින් සංචාරක ආකර්ෂණයට සුදුසු පරිශ්‍රයක් ලෙස සමාජගත කිරීම අනිවාර්ය වේ. මෙහිදී කලාපීය සෙසු උරුම ස්ථාන සමඟ ස්තානුබද්ධ කරමින් නව සංචාරක කලාපයක් හඳුන්වා දෙන්නේ නම් එය වඩාත් කාලෝචිත උරුම කළමනාකරණ ක්‍රියාවලියකි.

## ආශ්‍රිත ග්‍රන්ථ


අනුර, ගුණවර්ධන, එච්.වී. (2012) *ගවේෂණ වාර්තාව.* රම්බා විහාර ව්‍යාපෘතිය. මධ්‍යම සංස්කෘතික අරමුදල.

*ගවේෂණ වාර්තාව* (1999) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව. ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

දොඩම්පල, ජී. (2009) *රුහුණු රම්බා විහාරය.* මධ්‍යම සංස්කෘතික අරමුදල. කොළඹ 07.